# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2002/39 - 2017 ජනවාරි මස 19 වැනි බ්‍රහස්පතින්දා - 2017.01.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංක : IR/21/26/2010

### කාර්මික ආරාවුල් පනත 131 වැනි අධිකාරය

131 වැනි අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2011.12.29 දිනැති හා අංක 1738/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2011.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පදිංචි ජාතික සේවක සංගමය (වී.ජී. නන්ද නිමල් මයා වෙනුවෙන්) හා අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 500 හි පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2016.10.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එම්. ඩී. සී. අමරතුංග,
කම්කරු කොමසාරිස්.

2017 ජනවාරි මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංක : IR/21/26/2010

කාර්මික අධිකරණයේ දී ය.

ජාතික සේවක සංගමය,
(වී.ජී. නන්ද නිමල් මහතා වෙනුවෙන්)
අංක 416, කෝට්ටේ පාර,
පිටකෝට්ටේ.

නඩු අංකය : A - 3421 සහ

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,
අංක 500, ටී. බී. ජයා මාවත,
කොළඹ 10.

යන දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරවුල සම්බන්ධයෙන් වූ ප්‍රදානයයි.

කම්කරු හා කම්කරු සබඳතා ඇමති වන ගාමිණී ලොකුගේ මහතා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත් වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරුවෙකු වශයෙන් 2011.12.23 දිනැති නියෝගයෙන් මා පත් කොට මා වෙත යොමු කොට ඇත.

ඉහත කී දෙපාර්ශ්වය අතර පැවති කාර්මික ආරවුලට හේතු වී පැවති කරුණු වූයේ

1. වී. ජී. නන්ද නිමල් යන පැමිණිලිකරු 1995.10.10 දින ආරක්ෂක සුපරීක්ෂක I වන ශ්‍රේණියේ පිහිටුවීමට කටයුතු කළ ද එය අනෙකුත් ආරක්ෂක සුපරීක්ෂකවරුන්ට පිරිනමා තිබූ ආකාරයට 1990.03.01 දිනට පෙරදාතම් කොට ඒ මත ඉල්ලුම්කරුට ලැබිය යුතු පසු වැටුප් ලබා දීම

2. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බඳවා ගැනීම් පරිපාටිය අනුව

(අ) I ආරක්ෂක සුපරීක්ෂක I තනතුර 1990.03.01 දිනට පෙරදාතම් වූ විට ඒ ළඟ උසස්වීම වූ ආරක්ෂක නිලධාරි තනතුර ඔහුට ලැබිය යුත්තේ 1994.03.01 දින දීය. එබැවින් ඔහුට 1997.06.01 දින සිට ලබා දී ඇති ආරක්ෂක නිලධාරි තනතුර 1994.03.01 දිනට පෙරදාතම් කොට ඒ මත හිමි විය යුතු පසු වැටුප ලබා දීමට ද,



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(ආ) II ඉන් වසර 3 ට පසු එනම් 1997.03.01 දින සිට ඊළඟ උසස්වීම වූ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ii ශ්‍රේණිය ලබා දී ඒ මත ඉල්ලුම්කරුට හිමි විය යුතු පසු වැටුප් ලබා දීමට ද,

(ඇ) III ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ii තනතුරේ වසර 02 ක සේවා කාලයකින් අනතුරුව එනම් 1999.03.01 දින සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I ශ්‍රේණිය ලබා දී ඒ මහතාට හිමි විය යුතු පසු වැටුප් හා දීමනා ලබා දීමට ද,

(ඈ) IV ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I තනතුරේ වසර 03 ට පසු එනම් 2002.03.01 දින සිට ලැබිය යුතු ප්‍රාදේශීය ආරක්ෂක කළමනාකාර iii වන ශ්‍රේණියේ තනතුර ලබා දී ඒ මත හිමි විය යුතු පසු වැටුප් හා සියළු හිඟ දීමනා ලබාදීම යන්න පිළිබඳව වේ.

දෙපාර්ශ්වයම සිය ප්‍රකාශ උත්තර හා ප්‍රති උත්තර ගොනු කිරීමෙන් අනතුරුව සමථයක් සඳහා විමසා සිටියත් එවැන්නක් නොවූයෙන් මෙකී ආරවුල 2012.06.26 දින විභාගයට ගන්නා ලදී. මෙම විභාගය සඳහා ඉල්ලුම්කරු වෙනුවෙන් නියෝජිත එම්. කේ. හේමපාල මහතා ද වගඋත්තරකාර පාර්ශ්වය වෙනුවෙන් වගඋත්තකරුගේ නීති නිලධාරිනි ප්‍රසංගා මහත්මිය ද පෙනී සිටියහ. ඉල්ලුම්කරු වෙනුවෙන් පැ 1 සිට පැ 59 දක්වා ලේඛන ඉදිරිපත් කරමින්ද වග උත්තරකරු වෙනුවෙන් R 1 සිට R 24 දක්වා ලේඛන ඉදිරිපත් කරමින් විභාගය සඳහා සාක්ෂි මෙහෙයවන ලදී. වගඋත්තරකරුගේ විස්තර ප්‍රකාශය 2012.05.29 දින ඉදිරිපත් කළ ද ඉල්ලුම්කරුගේ විස්තර ප්‍රකාශ 2012.01.30 හා 2012.06.11 දිනැති විස්තර ප්‍රකාශ හා උත්තර ප්‍රකාශ කෙරෙහි. දෙවන උත්තර ප්‍රකාශ සඳහා 2012.06.13 දින කල් ඉල්ලා ඇතත් විභාගය අතරතුර කිසිම අවස්ථාවක එය ඉදිරිපත් කොට නැත.

මෙම බේරුම්කරණයේ ඉල්ලුම්කරු ඃ සිය නඩුව ඉදිරිපත් කරමින්

I. 1985.06.12 සිට 2011.02.28 විශ්‍රාම ගන්වන දින දක්වා වගඋත්තරකරුගේ සේවයෙහි යෙදී සිටි බව

II. මහවැලි ආරක්ෂක අංශයේ සේවයේ යෙදී සිටින අතරතුර වැවිලි කර්මාන්ත රාජ්‍ය ඇමතිතුමාගේ ආරක්ෂක සේවය සඳහා 1989.04.01 සිට මුදාහැර සිටි බව,

III. 1994 වසරේ නැවත මහවැලි ආරක්ෂක අංශය වෙත වාර්තා කිරීමෙන් අනතුරුව තමා භාරයේ තිබූ ගිනි අවිය හා පතරොම් ආදිය බාර ගත් වගඋත්තරකරු (පැ 59 හි දැක්වේ) තමාගේ සේවය සඳහා ඉල්ලුම්කරු නැවත නොකැඳ වූ බව,

IV. සේවයට වාර්තා කිරීම සඳහා ඉඩකඩ වගඋත්තරකරු ලබා නොදුන් බව ද ඒ බැවි කම්කරු කොමසාරිස්වරයාට පැමිණිලි කිරීමෙන් අනතුරුව 1995.09.01 දින සේවයට නැවතත් කැඳවූ බව හා එහි දී හිඟ වැටුප් හා වර්ධක ද ලබා දුන් බව,

V. වගඋත්තරකරුගේ අනෙකුත් ආරක්ෂක සුපරීක්ෂකවරුන් 1990.03.01 සිට 1 වන ශ්‍රේණියට උසස් කොට ඇතත් ඉල්ලුම්කරුට එම උසස්වීම ලබා දී ඇත්තේ 1995.10.01 දින සිට බැවින් තමාට සේවා ජ්‍යෙෂ්ඨත්වයෙන් අනෙකුත් සහෝදර සේවකයින් අතරින් පාඩුවක් සිදු වූ බව, (උදා ඃ පැ 15(ඒ) සහ කාර්ය සටහන් 2012.08.09 පිටු අංක 11, 12, 13)

VI. තමා ආරක්ෂක නිලධාරි තනතුරට 1997.06.01 දින සිට පත් කර ඇති බවත්, එහෙත් එකී තනතුර තමාට 1990.03.01 දින සිට පෙරදාතම කොට ලැබීමට වගඋත්තරකරු එකඟ වූ බව ද පැ 16 ඒ මගින් තහවුරු වන බවත්

VII. තමා ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි තනතුරේ වැඩ ආවරනය සඳහා පත් කළ බව පැ 21 මගින් ඔප්පු කළ හැකි බව ද මෙම පැ 21 ලිපිය වගඋත්තරකරු විසින් මෙම ඉල්ලුම්කරු වෙත නිකුත් කරන ලද ලේඛනයක් බවට පිළිගත හැකි සාක්ෂි එකී ලේඛනයෙහි පවතින බව (එය ඔප්පු කිරීමට යටතේ නොවේ යයි හඟිමි.)

VIII. වගඋත්තරකරු විසින් ඉල්ලුම්කරු කැමැත්තෙන් සේවය හැර ගියෙකු යන චෝදනාවට ලක් කළ ද ඒ සම්බන්ධව කම්කරු කොමසාරිස්තුමා විසින් පවත්වනු ලැබූ පරීක්ෂණයෙන් නිදහස් වූ ඉල්ලුම්කරු නැවත සේවයෙහි පිහිටු වූ බවත්,

IX. වගඋත්තරකාර ආයතනයේ අනෙකුත් ආරක්ෂක සුපරීක්ෂකවරුන් මෙන් ඉල්ලුම්කරු ද 1990.03.01 සිට ආරක්ෂක සුපරීක්ෂක I ශ්‍රේණියට උසස් කොට තමාට බලපා ඇති ශ්‍රේණි විෂමතාවය නිරවුල් කළ හැකි බව පාලන නිලධාරි (පීරිස්) විසින් නිර්දේශ කළ යුතු බැවි පැ 15 මගින් නිර්දේශ කොට ඇති බවත්

X. ඉල්ලුම්කරු මහවැලි ආරක්ෂක අංශයේ සිට වැවිලි රාජ්‍ය අමාත්‍යවරයාගේ ආරක්ෂක නිලධාරියෙකු ලෙස මහවැලි අධිකාරියේ සේවයෙන් කලක් මුදා හැර සිටි බවත්,

XI. පැ 54 අනුව තමා රාජකාරි සඳහා භාර ගත් පතොරම් හා ගිනි අවි භාරදීම් හා භාර ගැනීම් පිළිබඳ සාක්ෂි මගින් තමා සේවයේ අඛණ්ඩව යෙදී සිටි බැවි මනාව ඔප්පු වන බවත්,

XII. වගඋත්තරකරුගේ අධ්‍යක්ෂ (පිරිස්/පාලන) ගේ අංක එම්. ඒ. එස්. එල්. /විභාග/08 දරන අංකයෙන් යුත් 1993.04.24 දිනැති මහවැලි අධිකාරියේ සියලුම ඒජන්සි ප්‍රධානීන් හා ආයතන ප්‍රධානීන් වෙත නිකුත් කරන ලද චක්‍රලේඛය පරිදි 1987 සිට 1990 දක්වා උසස්වීම් නවතා තිබීම ද, බඳවා ගැනීමේ පරිපාටිය ක්‍රියාත්මක වීම ප්‍රමාද වීම ද යන කරුණු සලකා බලා 1990.03.01 සිට 1991.12.31 දක්වා කාලය තුළ යෙදෙන ශ්‍රේණිගත උසස්වීම් ඉහත කී අනුපාතයෙන් තොරව ලබා දිය යුතු යයි ලේකම් ජනරාල් විසින් තීරණය කර තිබීම එනම් පැ 43 හි ප්‍රතිපාදන සේවයෙන් මුදා හැර සිට වෙනත් ආයතනයක සේවයේ යෙදී සිටි ඉල්ලුම්කරු දැනුවත් කිරීමට වගඋත්තරකරු අපොහොසත් වූ බව ආදී කරුණු මනාව ඔප්පු කර සිටියේ ය.

මෙම බේරුම්කරණයේ වගඋත්තරකාර දෙවන පාර්ශ්වයේ සාක්ෂි හා හරස් ප්‍රශ්න ඉදිරිපත් කිරීම හා ලිඛිත දේශන යන පියවරයන් මත පහත කරුණු ඉදිරිපත් කර ඇත.

I. ඉල්ලුම්කරු වගඋත්තරකරුගේ සේවය සඳහා 1985.06.12 දින සිට ආරක්ෂක සුපරීක්ෂකවරයෙකු ලෙස සේවයට බැඳුනු බව

II. 1989.11.01 දින සේවය අත්හැර ගොස් ඇති බවත් 1995.09.04 දින කොන්දේසි සහිතව නැවත සේවයේ පිහිටුවා ඇති බව

III. ඉල්ලුම්කරු සේවය හැර ගොස් ඇති බව R 10, R 13 හා R 51 ලේඛන මගින් ඔප්පු කළ බවත්,

IV. සේවයෙන් ඉවත් කිරීම දන්වන ලද ලිපියේ තැපැල් භාණ්ඩ කුවිතාන්සිය ඉදිරිපත් කළ නොහැක්කේ එය අදාළ තැපැල් කාර්යාලය මගින් දන්වා ඇති පරිදි කල් ඉකුත් වීම හේතු කොට විනාශ කොට ඇති බැවින් ද

V. ''R 10, R 13, R 51 ලේඛනවලින් ද ඉල්ලුම්කරු සේවය හැර ගොස් ඇති බව ද, නිෂ්කාශන වාර්තා ඉදිරිපත් කර ඇති බව ද ඔප්පු කර ඇති බව'' ගරු අධිකරණයට සැල කර සිටින බව (ලිඛිත දේශන නඩු වාර්තාව 532 පිටුව)

VI. ''ආරක්ෂක නිලධාරි තනතුර 1994.03.01 දිනට පෙරදාතම කිරීමටත්. ප්‍රාදේශීය ආරක්ෂක කළමනාකාර III ශ්‍රේණිය ලැබීමට සුදුසුකම් ඇති බව හෝ තමා සුදුසුම පුද්ගලයා බව හෝ ඉල්ලුම්කරු සනාථ කොට නොමැත.'' යන්න ලිඛිත දේශන මගින් Perera Vs The Monetary board at the Central Bank (94 SLR 152) අනුව පැහැදිලි කර ගත් බව,

VII. ඉල්ලුම්කරු වෙනුවෙන් ඉදිරිපත් වූ සාක්ෂිකරු පුද්ගලික හැඳුනුම්කම් මත පක්ෂග්‍රාහී ලෙස සාක්ෂි දුන් බව,

VIII. යමෙකුගේ වැරදි ක්‍රියා හේතුවෙන් ඔහුට වාසි ලබා නොගත හැකි බව Riggs Vs Palmer 1889 නඩුව පරිදි පොදු නීති සංකල්පයන් ඉදිරිපත් වන බවත් මෙම ඉල්ලුම්කරුට ද එය අදාළ වන බවත්,

IX. විනිශ්චිත නඩු තීන්දු, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බඳවා ගැනීමේ පටිපාටිය අනුව ද ඉල්ලුම්කරු ඉල්ලා සිටින සහන ලබා දිය නොහැකි බව ද වගඋත්තරකරු වෙනුවෙන් ලිඛිත දේශන සමග R 1 සිට R 25 දක්වා සලකුණු කරන ලද ලේඛන ද ඉදිරිපත් කොට ඇත.

X. මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක MD/SAS/89 හා 89.04.03 දිනැති ලිපියෙන් මෙම ඉල්ලුම්කරු පතොරම් 43 හා මැගසින් 2 ද අංක 22270914 දරන පිස්තෝලය ද සමග එවකට වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේ ආරක්ෂක රාජකාරි සඳහා මහවැලි අධිකාරියේ සේවයෙන් මුදා හැර 1989 දෙසැම්බර් සිට 1994 ජූලි දක්වා අමාත්‍යාංශය මගින් වැටුප් ගෙවීම ද සිදු කොට ඇති බව,

XI. 1994.07.27 දින තමා නැවත සිය නිත්‍ය සේවා ස්ථානය වූ මහවැලි අධිකාරිය වෙත පැමිණිය ද එසේ වාර්තා කිරීමට ඉඩ ලබා දීමට නව රජයේ බලය ලත් නිලධාරින් ඉඩකඩ නොදුන් බවත් ඉහළින් ලත් නියෝගයක් හේතුවෙන් සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදුන් බව ද,

XII. එසේ සේවයට වාර්තා කිරීමට ඉඩ ලබා නොදීම, කම්කරු කොමසාරිස්තුමා වෙත වාර්තා කිරීමෙන් අනතුරුව නැවත 1995.10.01 දින තෙක් මාස 14 ක කාලයකට පසුව නැවත සේවය සඳහා වාර්තා කිරීමට සිදු වූ බව ද එකී කාල පරිච්ඡේදය සඳහා තමාට ලැබිය යුතු මුදල් රු. 60550/- ක් බව ද සාක්ෂාත් කිරීම.

XIII. මහවැලි අධිකාරියේ සියළු ආරක්ෂක සුපරීක්ෂකවරුන් 1990.03.01 සිට 1 වන ශ්‍රේණියට උසස්කර ඇතත් ඉල්ලුම්කරුට එසේ උසස්වීම ලබා නොදුන් බවත්

XIV. 1997.06.01 සිට කම්කරු කොමසාරිස්තුමාගේ මැදිහත් වීම මත තම උසස්වීම ලබා දී ඇතත් නියමිත දිනට එය ලබා නොදීම හේතුවෙන් (අ) මූල්‍යමය පාඩුවක් හා (ආ) ජ්‍යෙෂ්ඨත්වයෙන් පහළට වැටීමක් ද සිදු ව ඇති බව ආදී කරුණු ඉල්ලුම්කරුගේ වාසියට වගඋත්තරකාර පාර්ශ්වය ද ඉදිරිපත් කළ කරුණු වෙති.

**විශ්ලේෂණය**

ඉල්ලුම්කරු 1989.11.01 දින සේවය අත්හැර ගොස් සිටි සේවකයෙකු බවට වගඋත්තරකාර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ තර්කය පිළිගත නොහැකිය. එසේ පිළිගැනීමට නම් සිය කැමැත්තෙන් සේවය හැර ගිය බැව් දන්වා ලේඛනයක තැපැල් මගින් හෝ වෙනත් පිළිගත හැකි විධිමත් ක්‍රමයක් මගින් ඉල්ලුම්කරු දැනුවත් කළ යුතු ය. එකී ලිපිය ලියාපදිංචි තැපැල් මගින් යවන ලද බවත් එකී තැපැල් භාණ්ඩ කුවිතාන්සිය ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු අපොහොසත් වූයේ ලේඛන කල් පිරීම හේතු කොටගෙන විනාශයට පත් කොට ඇති බැවින් යයි (R 15) ඉදිරිපත් කරමින් කියා සිටී.

එහෙත් අදාළ ලිපියේ එකඳු පිටපතක් හෝ විභාගය අතරතුර ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු අපොහොසත්ව ඇත. නොදන්වා සේවයට නොපැමිණි බැව් දන්වන ලිපිය නියමිත දිනක් ඇතුළත සේවා යෝජක පත්වීම් බලධරයා විසින් සිය අත්සනින් සකස් කොට වෙනත් අංශ වෙත (උදා : ගිණුම්/ගණකාධිකාරී, විගණන ප්‍රාදේශීය නිලධාරීන් වෙත හා පෞද්ගලික ලිපිගොනුව වෙත, නිවාඩු ලිපිකරු වෙත) පිටපත් සිය අත්සනින් යුතුව සකසා යැවිය යුතු වේ. එය විනය නිලධාරිතැන සතු අනිවාර්ය අංගයකි. එහෙත් මෙහි දී කිසිදු පිටපතක් ඉදිරිපත් කිරීමට වගඋත්තරකරු අසමත්ව ඇත. එබැවින් සේවය අත්හැර ගියෙකු ලෙස සැලකීමේ තර්කය බිඳ වැටේ.

එපමණක් නොව, සේවය අත්හැර ගියෙකු ලෙස සලකනු ලැබුව ද එකී සේවකයා/නිලධාරියා නැවත සේවයට බඳවා ගනු ලැබුවේ නම් කිසිදු ආකාරයක දඬුවම් ලබා දීමට සේව්‍යාට හිමිකමක් නොපවතී. යම් දඬුවමක් ලබා දිය හැක්කේ සේවය අතහැර යාම සම්බන්ධයෙන් වගකීම සේවකයා කෙරෙහි පැටවී ඇතොත් පමණි. එවැන්නක් මෙහිදී පැන නොනඟී. වගඋත්තරකරු සේවයෙන් ඉවත් කිරීමේ ලිපියක් ඉදිරිපත් නොකිරීම ඒ බැව් ඔප්පු කිරීමට බාධාවක්ව පවතී.

තවද, නැවත සේවය සඳහා කැඳවීමේ ලිපිය එනම් 1995.09.04 දිනැති අංක එම්. ඒ. ඒ2/එච්.එම්./එම්.එස්.ඕ/පොදු/01 /(වෙ:2) දරන අධ්‍යක්ෂ (ව්‍යාපෘති හා පාලන) ගේ ලිපිය පැ 12 වශයෙන් ඉල්ලුම්කරු සලකුණු කරන ලිපිය කොතරම් නීත්‍යානුකූල දැයි සැක සහිතය. මෙවැනි අවස්ථාවක සහ සේවයෙන් පහ කරන අවස්ථාවක ද අදාළ ලිපිය පත්වීම් බලධාරියා සිය අත්සන යොදා බලගැන්විය යුතු වේ. එනම් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්වරයාම අත්සන යෙදිය යුතු ය. ඔහු ප්‍රධාන විනය නිලධාරී තැන වන හෙයිනි. මෙහි දී විනය නිලධාරී තැන තම බලය අභිනියෝජනය කර ඇද්ද යන්න තීරණය කළ නොහැක. එහෙත් සේවය අවසන් කර ලිපිය ඉදිරිපත්ව නැති බැවින් එය විමසීම අසීරුය. එහෙත් යළි සේවයට කැඳවීමේ ලිපිය ආයතනයේ විනය බලධාරියා වෙනුවට එනම් අධ්‍යක්ෂ ජනරාල් වෙනුවට අධ්‍යක්ෂ ව්‍යාපෘති/පාලන අත්සන යොදා නිකුත් කිරීම බලය අභිනියෝජන ක්‍රියාදාමයක් සේ සැලකිය හැකිය. ඊට බලයක් අධ්‍යක්ෂහට නොපවත්නා බැව් මාගේ මතයයි. තව ද ලිපියේ පිටපත් ප්‍රධාන ගණකාධිකාවරයෙකු හෝ නිවාඩු ලිපිකරුට හෝ නියෝජ්‍ය ආයතන අධ්‍යක්ෂවරයෙකුට ඉදිරිපත් කොට නැත. ඒ අනුව පැ 12 බලාත්මක භාවය සැක සහිත වේ.

තවද මෙම නැවත සේවයේ පිහිටුවීම යන ශීර්ෂයෙන් යුත් ලිපිය පෙර සේවය නතර කළ ලිපිය හා සම්බන්ධ බැව් ඉල්ලුම්කරු වෙත දැන්විය යුතු වුව ද එසේ පෙර දිනයක් හා බැඳෙන සේවය අවසන් කිරීමේ ලිපිය හා බැඳෙන බැව් සඳහන් නොකිරීම ද සේවය නතර කළ බැව් වගඋත්තරකරුගේ ප්‍රකාශය කෙරෙහි සැකයෙන් බැලීමට හේතු වේ.

එපමණක් නොව නැවත සේවයේ පිහිටුවීම යන ශීර්ෂයෙන් යුත් ලිපියේ (පැ 12) අඩංගු 01, 02, 03 යන නියමයන් බලවත් පක්ෂය විසින් දුබල පක්ෂය වෙත කරන ලද දඬුවම් සේ සැලකිය හැකි කරුණු වෙති.'' ඔබ කලින් දරූ ................. තනතුරේ නැවත සේවයේ පිහිටුවනු ලැබේ.'' යනුවෙන් ද ඔබ පහත සඳහන් කොන්දේසින්ට යටත්ව වහාම ක්‍රියාත්මක වන පරිදි නැවත සේවයේ යොදවනු ලැබේ.'' එහෙත් ඒ මත පනවා ඇති කොන්දේසි දඬුවම් ලෙස සැලකේ. දඬුවම් ලැබීමට නම් වරදක් සිදු කොට තිබිය යුතු ය. ඒ වරද මෙහි සඳහන්ව නැත. ඒ අනුව අඛණ්ඩ සේවයේ යොදවා ඇති ඉල්ලුම්කරු දඬුවම් කීපයකට යටත් කොට ඇති බැව් පෙනේ.

ඉල්ලුම්කරු සේවයේ නැවත පිහිටුවා තිබීම හේතුවෙන් ඔහු කැමැත්තෙන් සේවය අතහැර ගියෙකු සේ සැලකීම කෙසේවත් නොපිළිගත යුතු වේ. ''පැ 14'' ලෙස සලකුණු කරන ලද වගඋත්තරකරුගේ පරිපාලන නිලධාරී (පිරිස්) ගේ අංක මආස/පා/13/1 හා 1996.04.30 දිනැති ලිපිය ප්‍රකාරව වැටුප් වර්ධක ගෙවීමට පියවර ගත් බැව් දැනුම් දෙමින් තව දුරටත්'' ඔබ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සේවය සඳහා නිල වශයෙන් 89.04.01 දින මුදා හැර ඇති අතර එහි සේවය කළ කාල පරිච්ඡේදය සඳහා ඔබට වැටුප් වර්ධක නොලැබී ඇත්නම් නියමිත වැටුප් වර්ධක සමග වැටුප් තලයේ තබා හිඟ වැටුප් රහිතව ගෙවන ලෙස දැනුම් දී ඇත.'' මේ අනුව ඉල්ලුම්කරුගේ සේවය අඛණ්ඩව පැවති බව වගඋත්තරකරු පිළිගෙන ඇත. එනම් 89.06.12 සිට පිළිවෙලින් වාර්ෂික වැටුප් වර්ධක 1995.06.12 දින දක්වා වැටුප් පරිමාණය සහ වැටුප් අවස්ථා දක්වා ඇත. උදා : පැ 14, පැ 14(A), පැ 14(B), පැ 14(C), පැ 14(D), සහ පැ 15 (පැ 15 අනුව ආරක්ෂක සුපරීක්ෂක (1) 1990.03.01 දින සිට පෙරදාතම කිරීම.)

පැ 29 අනුව ඉල්ලුම්කරු වෙත හිඟ පාරිතෝෂික රු. 136,858.80 ක මුදලක් වගඋත්තරකරු විසින් ගෙවීමට ක්‍රියා කළ බව ස්ඵුට වේ.

වගඋත්තරකරුගේ නීති නිලධාරිතුමියගේ එක් තර්කයක් වූයේ සිතාසි ලබා නොදුන් සාක්ෂිකරුවෙකු ඉල්ලුම්කරු වෙනුවෙන් සාක්ෂි ලබා දීම නීතියට පටහැනිය යන තර්කයට දිය හැකි පිළිතුර නම්, යම් බේරුම්කරණ විභාගයක දී ඉල්ලුම්කරුගේ නඩුව අවසන් කළ පසු තමා වෙනුවෙන් යම් සාක්ෂි කැඳවීමක් වේ දැයි විමසීමයි. එහි දී යම් සාක්ෂිකරුවෙකු පිළිතුරු දුන් පසු හෙතෙම ඊළඟ නඩු දිනයේ දී කැඳවන ලෙසට දැන්වීමෙන් අනතුරුව එම සාක්ෂිකරු කැඳවීම සිදු වේ. ඒ අනුව සාක්ෂිකරුවෙකු කැඳවා තිබීම නීතියට පටහැනි නොවේ. එසේම වගඋත්තකරුගේ පාලන නිලධාරී තැන සාක්ෂියට කැඳවීම සිදු කොට ඇත්තේ ද එම පරිපාටිය අනුව මිස සිතාසි නිකුත් කිරීමෙන් අනතුරුව නොවේ. එබැවින් ඉල්ලුම්කරුගේ සාක්ෂිකරු කැඳවීම සම්බන්ධයෙන් ලිඛිත දේශනයේ සඳහන් කරුණු ප්‍රතික්ෂේප කරමි. (ගොනුවේ 537 පිටුව)

වග උත්තරකාර පාර්ශ්වයේ ලිඛිත දේශන සමග ඉදිරිපත් කොට ඇති De Silva, Vs Peris හා Jayawickrama, Vs Lakshman යන නඩුවල තීරණයන් මෙම බේරුම්කරණ විභාගය කෙරෙහි සෘජුව හෝ වක්‍රව බල නොපාන බව දක්වමි.

ප්‍රධාන නඩු ගොනුවේ 539 පිටුව වගඋත්තරකරුගේ ලිඛිත දේශනයේ ''එසේම ඔහු ඉල්ලා සිටින පළමු සහනය එනම් ආරක්ෂක සුපරීක්ෂක තනතුර 1990.03.01 දිනට පෙරදාතම කිරීම කෙසේ වෙතත් සිදු කළ නොහැක. 1990.03.01 වන විට ඔහු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවකයෙකු ලෙස සේවය කර නොමැති අතර ආර්ථික වාසි පතා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සේවයට ගොස් 1989.11.01 දින සිට ඔහු ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සේවය හැර ගොස් ඇත. ''යන මතය සනාථ කිරීම සඳහා Riggs Vs palmer (1889) "No One Should be permitted to profit by his own wrong'' යන ප්‍රකාශය ගෙන හැර පා ඇත. එය එසේම සිදු වී ඇත් ද යන්න ඉල්ලුම්කරුගේ සේවයට (නැවත) කැඳවීම, සියළු වැටුප් වර්ධක හා පාරිතෝෂික ගෙවීම් ආදී කරුණු සැලකිල්ලට ගත් කළ වරද කළේ කා විසින් දැයි පැහැදිලි වේ. ඉල්ලුම්කරු තම සේවා ආයතනයෙන් ලිඛිත අවසරය ලබාගෙන වැවිලි අමාත්‍යාංශයේ සේවයට ගොස් ඇත.

ඉල්ලුම්කරු විසින් සලකුණු කරන ලද පැ 30 හා පැ 30 (a) අනුව මහවැලි ආරක්ෂක සංවිධානය තුළ උසස්වීම් යන ශීර්ෂයෙන් යුත් 1991.12.13 දිනැති MA/UO/AAM/01 අංකයෙන් යුත් ලිපිය අනුව ආයතනයේ පුරප්පාඩු 1990.01.01 දින සිට පිරවිය යුතු බව ඉල්ලුම්කරු විසින් සාක්ෂියේ දී හෙළි කරන ලදී. සේවයෙන් මුදා හැර සිටි කාලයේ ආරක්ෂක සුපරීක්ෂක I ශ්‍රේණිය සඳහා අයදුම්පත් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බව ප්‍රකාශ කරයි.

තවදුරටත් කේ. පී. ජී. අමරදාස MA/ADM/PF947 ද ඒ. වෙදගෙදර අංක MA/ADM/PF1820 ද යන ආරක්ෂක අංශයේ නිලධාරී දෙදෙනාගෙන් පළමු අය 1989/09/22 සිට ආරක්ෂක නිලධාරී ලෙසත් 1997.05.02 සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී II ශ්‍රේණියට ද, 2002.04.01 ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරී I ශ්‍රේණියට ද 2013.06.01 සිට ප්‍රාදේශීය ආරක්ෂක කළමනාකරු 1 ලෙස ද උසස්වීම් ලබා දුන් බැව් පැ 31 හා පැ 36 අනුව හෙළි වේ.

ඒ. වෙදගෙදර 1994.09.06 ආරක්ෂක නිලධාරි, 2001.07.01 ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි 1 2005.09.01 ප්‍රාදේශීය ආරක්ෂක කළමනාකාර II ලෙස උසස් කළ බැව් පැ 37 හෙළිදරවු කරයි. හෙතෙම ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි (I) ශ්‍රේණිය ලබා දී ඇත්තේ එහි II ශ්‍රේණිය අභිබවා ගොස් වේ.

යූ. ඩී. ඒ. ජයන්ත - 1997.10.10 සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි ලෙස උසස් කිරීම පී. බී. දරාකුඹුර 1985 සහකාර ආරක්ෂක නිලධාරියෙකු ලෙස බඳවාගෙන ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි II ලෙස පත්වීම් ලබා දී ඇත.

බී. එම්. පී. ඒකනායක MSC/PF/80/01 ගොනුව අනුව 1985.01.01 ආරක්ෂක නියාමක 1990.01.01 සහකාර ආරක්ෂක සුපරීක්ෂක II 1997.12.05 ආරක්ෂක සුපරීක්ෂක I හා 2002.05.15 ආරක්ෂක නිලධාරි ලෙස උසස්වීම් ලබා දී ඇත. ඉහත කී අයවලුන්ට උසස්වීම් ලබා දීමේ දී පිළිගත් ක්‍රමවේදයක් තුළ සිදු කළ බවට සාක්ෂි වගඋත්තරකරු ඉදිරිපත් කර නැත.

තව ද වගඋත්තරකරුගේ 2012 මැයි 29 දිනැති විස්තර ප්‍රකාශය පරිදි ඉල්ලුම්කරු 1985.06.12 දින ආරක්ෂක සුපරීක්ෂකවරයෙකු ලෙස මහවැලි අධිකාරියට බැඳුනු බව පිළිගනී. ඔහු 1989.11.01 සිට සිය සේවය අතහැර ගොස් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සේවය කළ බවත්, 1995.09.11 සිට නැවත සේවයට කොන්දේසි 4 කට යටත්ව බඳවා ගත් බවත්, අවශ්‍ය සුදුසුකම් ඉල්ලුම්කරු විසින් සපුරා නොමැති බැවින් උසස් කිරීම් ලබා නොදුන් බවත් ප්‍රකාශ කර සිටී. එහෙත් 2012.05.30 දිනැති ඉල්ලුම්කරුගේ උත්තර ප්‍රකාශය පරිදි මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය මත සේවයෙන් මුදා හැර තිබිය දී සේවය අතහැර ගිය බැව් සැලකීම සාවද්‍ය බව ප්‍රකාශකර සිටියි. සේවය නැවත පිහිටුවන ලද අවස්ථාවේ පනවන ලද කොන්දේසි 4 ම අභියාචන ඉල්ලීමක් මත ඉවත් කරවා ගන්නා ලද බැවින් ඉන් නිදහස්ව නැවත සේවයෙහි යෙදුන බවත්, සේවය අතහැර ගිය බැව් දක්වන කාල පරිච්ඡේදයට අදාළ වැටුප් වර්ධක හා හිඟ වැටුප් ඉල්ලුම්කරුට නැවත ගෙවීම හේතු කොටගෙන සේවය අතහැර යාමේ ක්‍රියාව සිදු නොවූ සිද්ධියක් සේ එම කරුණ මත සැලකීමට හැකිව ඇත.

තව ද මෙම ඉල්ලුම්කරු වගඋත්තරකාර ආයතනයේ නැවත සේවය සඳහා බඳවා ගත් පසු ප්‍රාදේශීය ආරක්ෂක කළමනාකරු III ශ්‍රේණියට පත් කිරීම සුදුසු බැව් කම්කරු කොමසාරිස්තුමාගේ SID/D/266/2007 හා 2009.03.15 දරන ලිපිය (පැ 24) සාක්ෂි දරයි. ඒ අනුව යොමුවේ සඳහන් උසස්වීම් වගඋත්තරකාර අධිකාරිය විසින් ලබා නොදුන් බැව් ස්ඵුට වේ.

නිගමනය

ඉහතින් දක්වන ලද වගඋත්තරකරුගේ ඇතැම් වැරදි පියවර හේතු කොටගෙන ඉල්ලුම්කරුට අගතියක් සිදු වී තිබීම ඉල්ලුම්කරුට හැර වගඋත්තරකාර ආයතනයේ සමාන නිලයන්ට පරිපාටියකින් තොරව උසස්වීම් ලබා දීම ආදී කරුණු මත මෙම ඉල්ලුම්කරුට කිසියම් ආකාරයට අසමාන සැලකිලි දැක්වීම, සේවයට නොපැමිණි ඇතැයි යන සාවද්‍ය මතය තුළ සේවයෙන් පහ නොකොට ඒ බැව් ඔප්පු කිරීමට වගඋත්තරකරු අපොහොසත් විය. වැදගත් ලේඛන ඉදිරිපත් කිරීමට ද අපොහොසත් වීම. ආදී කරුණු සලකා බලත් ඉල්ලුම්කරුගේ වාසියට මෙම ප්‍රදානය කළ යුතුව ඇත. යොමුවෙහි (1) කරුණ වනුයේ ''වී. ජී. නන්ද නිමල් යන පැමිණිලිකරු 1995.10.10 දින ආරක්ෂක සුපරීක්ෂක I වන ශ්‍රේණියේ පිහිටුවීමට කටයුතු කළ ද එය අනෙකුත් ආරක්ෂක සුපරීක්ෂකවරුන්ට පිරිනමා තිබූ ආකාරයට 1990.03.01 දිනට පෙරදාතම කොට ඒ මත ඉල්ලුම්කරුට ලැබිය යුතු පසු වැටුප් ලබා දීම.'' යන්නට බේරුම්කරන ප්‍රදානයේ තීරණය මෙසේ ය.

1989.06.12 දිනට ලැබූ වැටුප 2400-2x50-13x75 =3475 වැටුප් පියවර - 2725/- ආරක්ෂක සුපරීක්ෂක (I) - 1990.03.01 උසස්වීම් වැටුප් පරිමාණය - 3660-15x100=5160/-

| *දිනය* | *වැටුප් පියවර* | *ලැබූ වැටුප* |
|---|---|---|
| 1990.03.01 | 3660/- | 2725/- |
| 1991.03.01 | 3760/- | 2800/- |
| 1992.03.01 | 3860/- | 2875/- |
| 1993.03.01 | 3960/- | 3595/- |

ඉහත පරිදි ගණනය කොට හිඟ වැටුපක් ගෙවීමට ඇත්නම් එය ගෙවීමට නියෝග කරමි.

යොමුවෙහි සඳහන් (02) කරුණ වූයේ.

''ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ බඳවා ගැනීමේ පරිපාටිය අනුව

(අ) ආරක්ෂක සුපරීක්ෂක I තනතුර 1990.03.01 දිනට පෙරදාතම වූ විට ඊ ළඟ උසස්වීම වූ ආරක්ෂක නිලධාරි තනතුර ඔහුට ලැබිය යුත්තේ 1994.03.01 දින දීය. එබැවින් ඔහුට 1997.06.01 දින සිට ලබා දී ඇති ආරක්ෂක නිලධාරි තනතුර 1994.03.01 දිනට පෙරදාතම කොට ඒ මත හිමි විය යුතු පසු වැටුප ලබා දීම ද'' යන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමේ දී පහත සඳහන් පරිදි ඉල්ලුම්කරු වෙත ගෙවීම් සිදු කළ යුතු ය.

එනම්,

ආරක්ෂක නිලධාරි 1994.03.01 උසස්වීම

වැටුප් පරිමාණය 7845-5x205-10-11120/-

| | | |
|---|---|---|
| 1994.03.01 | 7845/- | 4225/- |
| 1995.03.01 | 8050/- | 4225/- |
| 1995.09.30 | - | 4225/- |
| 1995.10.01 | - | 4460/- |
| 1996.03.01 | 8255/- | 4560/- |

ලෙස සලකා වැටුප් පියවරෙහි පිහිටුවිය යුතුය.

යොමුවෙහි සඳහන් අනෙකුත් කරුණ වූ,

2 (ආ) එනම්'' ඉන් වසර 3 කට පසු එනම් 1997.03.01 දින සිට ඊ ළඟ උසස්වීම වූ ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි II ශ්‍රේණිය ලබාදී ඒ මත ඉල්ලුම්කරුට හිමි විය යුතු පසු වැටුප් ලබා දීමට ද'' යන යොමුවෙහි සඳහන් කරුණ කෙරේ පහත සඳහන් පරිදි ගෙවීම් කරන ලෙස ද නියෝග කරමි.

ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි II - 1997.03.01 උසස්වීම

වැටුප් පරිමාණය 9475-10X225-11725/-

| | | |
|---|---|---|
| 1997.03.01 | 9475/- | 7100/- |
| 1997.06.01 | 9475/- | 7298/- |
| 1998.03.01 | 9700/- | 9095/- |
| 1998.06.01 | 9700/- | 9320/- |
| 1999.03.01 | 9925/- | 9295/- |
| 1999.06.01 | 9925/- | 9545/- |
| 2000.03.01 | 10150/- | 9995/- |

2 (ඇ) ''ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි II තනතුරේ වසර 02 ක සේවා කාලයකින් අනතුරුව එනම් 1999.03.01 දින සිට ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I ශ්‍රේණිය ලබාදී ඒ මහතාට හිමි විය යුතු පසු වැටුප් හා දීමනා ලබා දීමට ද, යන කරුණු කෙරේ පහත සඳහන් ආකාරයට ගෙවීම් කරන ලෙස ද නියෝග කරමි.''

ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I - 2001.03.01 උසස්වීම

වැටුප් පරිමාණය (2003) :- 11850-5X340-5X375=15425/-

වැටුප් පරිමාණය (2005) :- 16590-5X480-8X5525=21615/-

| | | |
|---|---|---|
| 2001.03.01 | 11850/- | 9995/- |
| 2001.06.01 | 11850/- | 10445/- |
| 2002.03.01 | 12190/- | 10670/- |
| 2002.06.01 | 12190/- | 10670/- |
| 2003.03.01 | 12530/- | 10895/- |
| 2003.06.01 | 12530/- | 10895/- |
| 2004.01.01 | 12530/- | 12145/- |
| 2004.03.01 | 12870/- | 12145/- |
| 2004.06.01 | 12870/- | 12370/- |
| 2004.12.01 | 16590/- | 14870/- |

2 (ඈ) ''ජ්‍යෙෂ්ඨ ආරක්ෂක නිලධාරි I තනතුරේ වසර 03 ට පසු එනම් 2002.03.01 දින සිට ලැබිය යුතු ප්‍රාදේශීය ආරක්ෂක කළමනාකාර III ශ්‍රේණියේ තනතුර ලබාදී ඒ මත හිමි විය යුතු පසු වැටුප් හා සියළු හිඟ දීමනා ලබා දීම'' යන යොමුවේ සඳහන් කරුණ කෙරෙහි පහත සඳහන් ආකාර ගෙවීම් කළ යුතු යයි නිගමනය කරමි. එනම්

ප්‍රාදේශීය කළමනාකාර (ආරක්ෂක) III උසස් කිරීම

වැටුප් පරිමාණය 12795-2X340-8X375=16475/-

වැටුප් පරිමාණය (2005) - 17915-2X480-8X525=23075/-

වැටුප් පරිමාණය (2006) -28965-7X475=32290/-

වැටුප් පරිමාණය (2006) -30225-7X550=34075/-

| | | |
|---|---|---|
| 2005.03.01 | 17915/- | 14870/- |
| 2005.06.01 | 17915/- | 15185/- |
| 2006.01.01 | 28965/- | 21434.25 |
| 2006.03.01 | 29440/- | 21434.25 |
| 2006.06.01 | 29440/- | 21749.50 |
| 2007.01.01 | 29440/- | 25280/- |
| 2007.03.01 | 29915/- | 25595/- |
| 2007.06.01 | 29915/- | 25595/- |
| 2008.03.01 | 30390/- | 25595/- |
| 2008.06.01 | 30390/- | 25910/- |
| 2009.03.01 | 30865/- | 25910/- |
| 2009.06.01 | 30865/- | 26225/- |

නව වැටුප් ප්‍රතිශෝධනය අනුව (30225) - 7 X 550 = 34075/-

| | | |
|---|---|---|
| 2009.01.01 | 32425/- | 27160/- |
| 2009.06.01 | 32425/- | 27505/- |
| 2010.06.01 | 32975/- | 27805/- |
| 2011.02.28 | 32975/- | 27805/- |

තවද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 30 හා 30(1) වැටුප් ගැලපීමෙන් අන්තර් ග්‍රහනය නිසි පරිදි සිදු කර නොමැති බැවින් තව දුරටත් එකී කටයුතු කෙරේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නිරතව 2006.06.22 හා කළමනාකරණ සේවා චක්‍රලේඛ 30 හා එය නැවතත් සංශෝධනය කර 2009.06.01 කළමනාකරණ චක්‍රලේඛ 30 (I) සංශෝධනය කර ඇති බැව් දැන ගන්නට ඇත.

ඒ අනුව ආරක්ෂක සුපරීක්ෂක I තනතුරේ සිට ප්‍රාදේශීය කළමනාකාර (ආරක්ෂක) III ශ්‍රේණිය දක්වා වන වැටුප් ගැලපීම් හා අන්තර් ග්‍රහණය කොට හිඟ වැටුප් හා දීමනා ඉහත ඉදිරිපත් කොට ඇති දත්තයන්ට අනුව රු.814707.50 ක මුදලක් ලබා දෙන ලෙස නිර්දේශ කර ඉදිරිපත් කරමි. මෙම මුදල බටහිර කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කිරීමට ද නියෝග කරමි.

මෙම ප්‍රදානය සාධාරණ හා යුක්ති සහගත බැව් සහතික කරමි. තවද මෙම ප්‍රදානය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ පළ වී එක් මසක් ඇතුළත ගෙවා නිම කිරීමටද නියෝග කරමි.

එස්. කාරියවසම්,
කාර්මික අධිකරණය,
බේරුම්කරණ මණ්ඩලයේ සාමාජික.

2016 ඔක්තෝබර් මස 20 දින දී ය.

02 - 142